# ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර)

# පැරණි ගද්‍ය සාහිත්‍යය

- පූජාවලිය
- සද්ධර්මාලංකාරය


රාජකීය පණ්ඩිත පදියතලාවේ ඤාණවිමල හිමි

සහකාර කථිකාචාර්ය

සිංහල අධ්‍යයනාංශය

පේරාදෙණි විශ්වවිද්‍යාලය

# පූජාවලිය

- පූජාවලිය රචනා වූයේ **දඹදෙණි අවධියේ** ය. (13වන සියවස)
- මෙකල රාජ්‍ය ගෙනගියේ දෙවැනි පරාක්‍රමබාහු හෙවත් කලිකාල සර්වඥ පරාක්‍රමබාහු රජු විසිනි. (1228-1269)
- ඔහුගේ රාජ්‍යෝදයෙන් 30වැනි වර්ෂයේ දී පූජාවලිය කරන ලදි (1266-1275)
- මෙහි කර්තෘවරයා වන්නේ බුද්ධපුත්‍ර හිමියන් ය.
- මෙය රචනා කිරීම පිණිස දේවප්‍රතිරාජ නම් වූ අමාත්‍යවරයා ආරාධනා කොට ඇත.
- උන්වහන්සේ යෝගාර්ණවය, ප්‍රයෝගරත්නාවලී යනුවෙන් වෛද්‍ය ග්‍රන්ථ 02ක් ද රචනා කොට තිබේ.

- පූජාවලියේ **පරිච්ඡේද 34කි**.
- පූජාවලී යනු පූජා වැල හෙවත් පූජා සමූහය යන අදහස දේ.
- නව අරහාදි බුදුගුණ අතුරින් **අරහං ගුණය** තේමා කොටගෙන මෙය රචනා කොට තිබේ.
- පූජාවලියේ සැම පරිච්ඡේදයක් ම අවසන් වන්නේ "**පූජා විසෙසං සහ පච්චයෙහි**" යනාදි ගාථා පාඨයෙනි.
- මෙහි **අරමුණ පරාක්‍රමබාහු රජු ලවා බුද්ධත්වය ප්‍රාර්ථනා කරවීම**යි. එසේම **ලෝවැඩ පිණිස** ද මෙය රචනා කොට ඇත.

පූජාවලියෙහි සාහිත්‍යයික අගය පිළිබඳ සිදුකළ විමසුම්වලදී ඇතැම් විචාරකයන් ඊට පූර්වකාලීන හා සමකාලීන කෘති හා තුලනය කොට **අගයෙන් හීන කෘතියක්** ලෙස බැහැර කරනු පෙනේ.

❑මේ පිළිබඳ අදහස් දක්වන මාර්ටින් වික්‍රමසිංහ සිංහල සාහිත්‍ය නැගීම කෘතියේ දී නිර්දය ලෙස විවේචනය කරමින් චිරන්තන ගද්‍ය කලාවේ කනිෂ්ඨ සම්ප්‍රදායේ ආරම්භය පූජාවලිය ලෙස දක්වයි. බුත්සරණ රීතිය ගත්ත ද පූජාවලිය මගින් එකී රීතිය දූෂණයට බදුන්ව ඇති බව ඔහුගේ අදහසයි. හුදු භක්තිය දනවන දේවකථා අන්තර්ගත කිරීමෙහි ශූරයෙකු වූ නිසා පූජාවලී කතුවරයා එකී අංශයෙන් විද්‍යාචක්‍රවර්තීන් අබිබවා සිටින බව පවසයි.

කෙසේ නමුත් ධර්මාසනයක වැඩ හිඳිමින් අසන්නන්ගේ ශ්‍රද්ධා භක්තිය දියුණු වන සේ මධුර ස්වරයෙන් හඬ නඟා පොත කියවන විලාසයක් ග්‍රන්ථය මගින් දැක ගත හැකිය.

# පූජාවලිය 31-34 පරිච්ඡේද

## අන්තර්ගතය

**31 පරිච්ඡේදය** - යශෝධරා චරිතය, පැවිදි වීම, ඈ බෝසතුන් සසරෙහි පෙරුම් පිරීමේ දී බුදුන්ට උපකාර වූ බව ජාතක 05කින් පැවසීම හා පිරිනිවනට අවසර ඉල්ලීම, පෙළහර පෑම, ජාතක කථා 23කින් පූර්වපක්ෂකම් දැක්වීම, සප්තවිධ භාර්යාවන් ගැන පැවසීම, දීපංකර බුදුරදුන්ගෙන් නියත විවරණ ලැබ තමන් ද සූවිසි බුදුවරුන්ගෙන් විවරණ ලැබ බුදුන්ට උපකාර කිරීම, පිරිනිවනට අවසර දී කළගුණ සැලකුම් වශයෙන් බුදුන් පසුගමන් යෑම, පිරිනිවන

**32 පරිච්ඡේදය** - බුද්ධකාරක ධර්ම තිහ, බුදුරදුන් වස් ගතකළ ස්ථාන, බුද්ධ පරිනිර්වාණය, මහාකාශ්‍යප හිමියන් හිමවතට වැඩීම, පසුව ආදාහණ උත්සවයට වැඩම කිරීම, ධාතු කෝලාහලය, ධාතු බෙදීම හා දශථූප කථා, ත්‍රිවිධ පරිනිර්වාණ, ත්‍රිවිධ සංගායනා

**33 පරිච්ඡේදය** - කකුසඳ ආදි බුදුවරුන් ලක්දිවට වැඩමවීම, අප ගෞතම බුදුන්ගේ ලංකාගමන අවස්ථා 3, අනුරාධපුර උත්පත්ති කථාව, ප්‍රත්‍යන්ත දේශයන්හි බුදුසසුන පිහිටුවීම, මහින්ද මාහිමියන් මෙරටෙහි බුදුසසුන පිහිටුවීම

**34 පරිච්ඡේදය** - විජය රජු පටන් පැරකුම්බා රජු තෙක් රාජාවලිය, දෙවනපෑතිස් රජු පටන් මහසෙන් රජු දක්වා මහාවංසයේ රජුන් කළ උද්දේසික පූජා කථා, චූලවංශයේ රජුන් කළ උද්දේසික පුණ්‍ය කර්ම, විජයබා, 11 පැරකුම්බා රජුන්ගේ උත්පත්ති කථා, ග්‍රන්ථ කර්තෘ සන්දර්ශනය සහ ප්‍රාර්ථනය

# පූජාවලී කතුවරයාගේ රචනා රීතිය

මෙය ශ්‍රෝතෘ ජනයා සඳහා රචනා කරන ලද්දක් බව හඳුනාගත හැකි මුඛ්‍ය ලක්ෂණය යි. ඒ සඳහා අවැසි භාෂා භාවිතයක් මෙහි වේ. එසේම රචනයෙහිලා බුද්ධපුත්‍ර හිමියන් දැක්වූ සාමර්ථ්‍යය මෙම කෘතියෙන් මැනවින් හඳුනාගත හැකිය.

පහතින් දැක්වෙන්නේ ඒ සඳහා කදිම නිදසුන් කිහිපයකි.

## සංස්කෘත මිශ්‍ර භාෂා භාවිතය

මෙම යුගයේ සංස්කෘත භාෂාවට සුවිශේෂ තැනක් හිමිව තිබුණි. සාමාන්‍ය භාෂා ව්‍යවහාරයේ පවා සංස්කෘත භාෂාව යොදා ගන්නට ඇත. කෙසේ නමුත් මෙහි අතරින් පතර සංස්කෘත වදන් දැකිය හැකිය. නමුදු බොහෝ තැන ඇත්තේ හෙළ බස් වහරයි.

- සුදොවුන් රජාණන් නැගණියන් අමිතා නම් බිසොවුන් කුස පිළිසිඳ බුදුන් හා සමයේ ම දෙතිස් මහා පූර්වනිමිත්ත නම් අද්භූත වූ ප්‍රතිසන්ධි පූජාවන් ලදින්, ඔබ සේ ම ගබපෙරහර මඟුල් ලදින් බුදුන් උපන් වෛශාඛ යෝගයෙන් ම එම විගස ම තුමූ ද මවු කුසිල් බිහි ව බුදුන් සේ ම ප්‍රසව මංගල පූජා ලදහ. **675 පිටුව**
- ඒ ජාතියෙහි මාගේ පහස් ලත් තැන් පටන් මා කෙරෙහි කළ ප්‍රේමයෙන් අන්‍ය ස්ත්‍රියක ප්‍රාර්ථනා නොකොට රැකි පඤ්චශීලාදියෙන් ශීල පාරමිතාව සිද්ධ විය. මා ම පතා ඒ සා රාජ්‍යය හැර එකලා ව ගිය ගමනින් නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව සිද්ධ විය. නො එක් කර්මාන්ත විශේෂයන් මා ම උදෙසා නිර්මිත කිරීමෙන් ප්‍රඥා පාරමිතාව සිද්ධ විය. **686 පිටුව**

මෙපරිද්දෙන් බුද්ධපුත්‍ර හිමි කෘතිය පුරාවටම තත්භව වදන් භාවිතයෙන් හා තත්සම වදන් භාවිතයෙන් කෘතියෙහි පාඨක රුචිය වර්ධනය පිණිස කටයුතු කර ඇත.

## ❖ අනුප්‍රාසයාවහ භාෂා භාවිතය

- ...බුදුන්ට කිරිමවුන් තෝරන සමයෙහි ඔවුන්ට ද <u>උතුම් උතුම්</u> වූ කිරිමවුන් තෝරා යවා එතැන පටන් සියලු මඟුල් ම බුදුන් <u>සම සමයෙහි</u> <u>එකී එකී</u> වේලාවෙහිම කරනා යෙහෙළණියනු දු මහ පෙරහරින් වැඩූහ...676 පිටුව
- රාහුල මාතාවෙනි! බුද්ධොත්පාද <u>දුර්ලභ ය</u>, ක්ෂණසම්පත්ති <u>දුර්ලභ ය</u>, බුද්ධ දර්ශන <u>දුර්ලභ ය</u>, මනුෂ්‍යත්ව <u>දුර්ලභ ය</u>, ප්‍රව්‍රජ්‍යා <u>දුර්ලභ ය</u>, සද්ධර්ම ශ්‍රවණ <u>දුර්ලභ ය</u>, අප්‍රමත්ත ව ත්‍රිවිධ වූ ශික්ෂාවන් සම්පාදනය කරව... 681 පිටුව
- මම වනාහි බුදුන් හා එක් වෙලෙහි උපන්මි, ඔබ හා සමවයස් <u>ලදිමි</u>, සම වූ මඟුල් <u>ලදිමි</u>, සම වූ අදහස් <u>ලදිමි</u>, සම වූ මහණ ධම් <u>ලදිමි</u>, සම වූ අමා <u>ලදිමි</u>, අනු වූ රූප ශ්‍රී හා ඍද්ධි ප්‍රාතිහාර්ය <u>ලදිමි</u>... 683 පිටුව

## ❖ උපමා බාහුල්‍යයෙන් යුක්ත රචනා ශෛලිය

- ඔබගේ පාරමිතා නමැති මහලියයට උදක සේතුකාවක් සේ අනුබල ව ආ කෙනෙක... **675**
- බෝසතුන්ට අගමෙහෙසිනි ව මන වඩා වැස පද්මයට පැමිණි ශ්‍රීකාන්තාව සේ ශ්‍රී සම්පත් වුන්හ. **676**
- සියලු පරිවාර ජනයන් හා සියලු සම්පත් මහමුහුදට වදනා ගංගා ප්‍රවාහයක් සේ ඒ යශෝධරා දේවීන් වහන්සේ කරා පැමිණියේ ය. **679**
- පංකයෙහි අමිශ්‍ර වූ පදුම රාජයක්හු සේ, දියෙහි තිබී දිය හා එක් නො වන පියුම්පතක් සේ... **679**
- නුඹවහන්සේ ම කිසියම් පාපයක් නිසා අතිරස පූවක් සේ ඉතා අප්‍රසාද වූ හෙයින් බැලුවන්ට භයංකර හෙයින්... **685**
- මේ සා මුළු සක්වල සිතියම් වියනකින් වැසුවා සේ අතුරු නොදී වසා සිට... **694**
- සුරතල් කියන පුතක්හු දුටු පියාණ කෙනෙකුන් සේ රජහු මහ කුළුණෙන් බලා... **763**

## ❖ කාව්‍යාත්මක භාෂා ව්‍යවහාරය

- සියලු පරිවාර ජනයන් හා සිය සම්පත්තිය ය යන මේ සියලු පරිවාර ජනයන් හා සියලු සම්පත් මහමුහුදට වදනා ගංගාප්‍රවාහයක් සේ ඒ යශෝධරා දේවීන් වහන්සේ කරා පැමිණියේ ය. මහමේරුව ගලා සිටිනා මහාසමුද්‍රය සේ ඒ සා මහත් සම්පත්තිභාරයක් උසුලන්නාහු, ඒ සා සැපත් තමන් ග්‍රීවයෙහි බැඳි අහිකුණපයක් කොටත් නොසිතා පංකජයෙන් ඉපැද පංකයෙහි අමිශ්‍ර වූ පදුම රාජයක්හු සේ, දියෙහි තිබී දිය හා එක් නොවන පියුම්පතක් සේ, තුදූ ද සම්පත් හා එක් නොව ලොභය අහසට පොළොව සේ දුරින් දුරුකොට... **679**

- නො එක් කර්මාන්ත විශේෂයෙන් විශේෂ වූ ශක්‍රපුරය දුත ඵලකයෙක සදා තුබු දු ඉත්තන් පානා සේ නිර්මල කොට දක්වා, නැවත ඔහු දෙවඟනන් පිරිවරා පාණ්ඩුකම්බලාසන පැනනැඟී හුන් ලීලා ය, දිවපිරිස් පිරිවරා සුදර්ශන නම් රන්වීථියෙහි නිකුත් ශ්‍රීවිභූති ය, තෙතිසකුඹෙහි වෙන වෙන මැවූ දළින් හා දළෙහි මැවූ දිව පොකුණෙන් හා පොකුණෙහි මැවූ පියුම් ගසින් හා ගසෙහි මැවූ පියුමෙන් හා පියුමෙහි පියුමෙහි මැවූ පෙති පෙත්තෙන් හා පෙත්තෙහි පෙත්තෙන් බැස නටන දිව්‍යාංගනා පෙළින්... **696**

**(707, 748, 755, 792 පිටු ද බලන්න)**

මීට අමතරව කෘතියේ **තැනින් තැන හමුවන කෙටි වැකි හා දිගු වැකි, නාට්‍යෝචිත අවස්ථා, කතාව ඉදිරිපත් කිරීමේ දී සංක්ෂිප්ත බව, කරුණු විස්තර කරනු පිණිස ගාථා භාවිතය ආදි** දෑ ද රචනා විලාශයේ දී හඳුනාගත හැකි සුවිශේෂ ලක්ෂණයෝ ය.

එසේම වාක්‍ය සංයෝජනයේ දී ද විවිධ වූ ලක්ෂණ හමු වේ

## මහාප්‍රාණාක්ෂර වදන් භාවිතය

විශේෂයෙන් ම මහාප්‍රාණ **ධ** අක්ෂරය සීමා රහිතව යොදා ඇදි බව පෙනේ.
එවැනි තැන් අතර

මහණ ධම්, ධරන, ධරා, ධරාගත, සාධා, සේධීමෙන්, සුබුමාල, ධම්සක් ආදි වදන් ගත හැකිය. (තවත් තැන් පරීක්ෂා කරන්න.)

## ඇකාරය භාවිතය

පැරුැම්, ඉපැද, මැනැව, බඩැ

## ද වෙනුවන දු ප්‍රත්‍යය යෙදීම

යෙහෙලණියනු දු, ඔවුනු දු, බෝසතුනුදු, අනුකම්පායෙනු දු, සිතිනු දු, උනුදු

## ගෞරවාර්ථ ප්‍රත්‍යය භාවිතය සමහර තැනෙක සම්මත වියරණ රටා නොතැකීම

- යශෝධරාවෝ නම් දඹදිවු තෙලෙහි අග්‍ර වූ රූ සම්පත්ති ඇතියහ. 677
- එකල ඔහු බිම්බරූපයක් බදු වූ රූප ශ්‍රී ඇති වූහ. 676

**(තවත් තැන් පිරික්සන්න)**

කෘතියෙහි අවසන් පරිච්ඡේදයේ අවසන් පිටු අතර තමාගේ කෘතියෙහි සමස්ත අන්තර්ගතය සංක්ෂිප්තව දැක්වීම ද විශේෂ ලක්ෂණයකි.

# පූජාවලී කතුවරයාගේ මුඛ්‍ය පරමාර්ථය පාඨකයන් උදෙසා ධර්ම උපදේශ ලබා දීමය

*බුද්ධ චරිතය අළලා රචිත බොහෝ සාහිත්‍ය කෘතීන්හි මුඛ්‍ය පරමාර්ථයක් නම් පාඨකයාට ධර්ම උපදේශ ලබාදීම ය. පූජාවලියෙහි ද එවැනි තැන් බෙහෙවින් හමුවේ.*

- රාහුල මාතාවෙනි! බුද්ධොත්පාද දුර්ලභ ය, ක්ෂණසම්පත්ති දුර්ලභ ය, බුද්ධ දර්ශන දුර්ලභ ය, මනුෂ්‍යත්ව දුර්ලභ ය, ප්‍රව්‍රජ්‍යා දුර්ලභ ය, සද්ධර්ම ශ්‍රවණ දුර්ලභ ය, අප්‍රමත්ත ව ත්‍රිවිධ වූ ශික්ෂාවන් සම්පාදනය කරව... **681 පිටුව**
- පෙර දෙනුවරටත් වඩා දිවුණ දිවුණා සත්කාර කළහ. මහත් වූ දාන පූජා කළහ. මෙසේ උන්වහන්සේ ලාභයෙන් යශසින් පිනින් අග පැමිණි සේක. මහමුහුද රළපෙළ දිවන්නා සේ නො එක් ප්‍රත්‍යදානය ඔබ කරා පැමිණියේ ම ය. එහි විපාක නම්.... දාන පරිත්‍යාග මහිමයෙන් උපන් පින් බලය ය යි දතයුතු. **682 පිටුව**

- වධක භාර්යයා ය, චෞර භාර්යයා ය, අයිර භාර්යයා යි දැක් වූ පාප ස්ත්‍රීන් තුන් දෙන දුශ්ශීල ව වාක්පරුෂයෙන් යෙදී පුරුෂයන්ට අනාදර කළා වූ මිත්‍රද්‍රෝහ සංඛ්‍යාත වූ අකුසල් බෙලෙමින් මිය නරකයෙහි ඉපැද බොහෝ කලක් දුක් ගන්නාහ.  එසේ හෙයින් සත්පුරුෂ වූ ස්ත්‍රීන් විසින් එබඳු වූ පාපගුණයන් අහසට පොළොව සේ දුරින් දුරුකොට පුරුෂයන් කෙරෙහි පක්ෂපාත ව විසිය යුතු. **702 පිටුව**
- ආචාරශීලයෙන් හා පතිපූජාවෙන් යෙදුනා වූ ගුණබලයෙන් මේ ජාතියෙන් මිය අපාය ඇසින් නොදක්නාහ. දෙවුලොව ම උපදනාහ. රූපයෙන් යශසින් අග්‍ර ව දිව්‍ය රාජයන්ට ම අගමෙහෙසියන් ව ශ්‍රී සම්පත් විඳිනාහ... **705 පිටුව**

- ඒ බිසවු මෙසේ වූ රූප ඓශ්චර්ය පිනක් ගිය ජාතියෙහි මී දන් දෙන ගෙයක් අත නඟා පැලූ කුශලයෙන් ලදහයි දත යුතු... **741 පිටුව**
- මුළු හෙළදිව අමාවළක් සේ කරවා, සතුන් නොමරන පරිද්දෙන් බෙර ලවා, සියලු සතුන් පවුකළ නො දී පින් කොට නව හවුරුදු අටමසක් රජය කොට දෙවුලොව ගිය. **774 පිටුව**

## ගිහි දිවිය සරු කරගනු පිණිස දුන් උපදේශ මෙහි බහුල ය.

- කල්‍යාණ වූ පුරුෂයන් විසින් ස්ත්‍රීන්ට ආදර සහිත වූ තෙපුල් කීම ය, අනාදර මිශ්‍ර වූ තෙපුල් නොකීමය, ස්වදාරායන් හැර පරදාරාවන් කෙරෙහි සක්ත නොවීම ය, භොජන සංවිධානයෙහි ස්ත්‍රීන් ම නායක කොට තිබීම ව, කලින් කලට තරම් වූ වස්ත්‍රාභරණ සපයා දීමය යන මේ පඤ්චස්ථාන සංග්‍රහයෙන්... **699 පිටුව**

- යම් ස්ත්‍රී කෙනෙක් රක්ෂා කළ ස්වාමීහු කෙරෙහි හැම වේලෙහි ම මවක බඳු අනුකම්පා ඇතියාහු ද, දායාද සම්පත් රක්ෂා කරන මවුන් සේ ස්වාමීහු රැස්කළ ධනය රක්ෂා කෙරෙද්ද, වේලා නොවරදවා පුරුෂයන් කවන්නාහු ද පොවන්නාහු ද උලන්නාහු ද කාවන්නාහු ද හැම වේලෙහිම පුරුෂයන්ගේ සුවදුක්හි ම යෙදී වෙසෙද්ද... 702 පිටුව

**(මෙහි ඇති 702 සිට 705 දක්වා ඇත්තේ යුගදිවියේ දී බිරිඳක කළ යුතු පිළිවෙත් ය.)**

- මනාව කරන ලද කර්මාන්ත විධානය, මනාකොට ආශ්‍රිත ජනයන් සිත් ගැන්මය, ස්වාමීහු හැර පරපුරුෂයන් කෙරෙහි සක්ත නොවීමය, රැස්කළ සම්පත් රක්ෂා කිරීමය, සිය¨ කාර්යයාකාර්යයෙහි අලස නොවී දක්ෂ වීමය.. 700 පිටුව

**(පෙර වෙළෙන්දෙක්ව මී පැණි පූජා කිරීමේ අවස්ථාව හා ඉන් ලැබුණු විපාක දැක්වෙන අවස්ථාව ද භාවිතයට ගන්න. 757-758 පිටු)**

# ඉතිහාස ග්‍රන්ථයක් වශයෙන් පූජාවලියෙහි වැදගත්කම

සාහිත්‍ය කෘතියකින් තත්කාලීන දේශපාලන සමාජ සංස්කෘතික ආගමික තොරතුරු රාශියක් ලබා ගත හැකිය. පූජාවලියෙහි බොහෝ තැන්වලින් මෙකී කරුණු ස්ඵුට වේ. වෙසෙසින්ම 32-34 පරිච්ඡේදවලින් භාරතීය සාසන ඉතිහාසයත් ලාංකේය සාසන ඉතිහාසයත් මැනවින් හැඳිනගත හැකි අතර මෙරටෙහි රාජ්‍යාවලිය පිළිබඳ අදහසක් ලබාගත හැකිය.

එහි දී භාරතීය රාජ්‍යාවලිය දක්වන අතර (739 පිටුවේ සිට) සිංහල රාජවංසය දැක්වීමත් (756 පිටුවේ සිට) වේ. 32වන පරිච්ඡේදයෙන් බුද්ධචරිතය, බුද්ධපරිනිර්වාණය පිළිබඳවත් ධාතුපූජා, ධාතු පරිනිර්වාණ කථා ආදියත් සංගායනා තුන පිළිබඳ තොරතුරුත් දත හැකිය. ලංකාවේ බුද්ධසාසනය ස්ථාපනය කිරීමේ තොරතුරු (766), දන්තධාතූන් වහන්සේ වැඩමවීම ආදි තොරතුරු ද ඇතුළත් ය. මේ සමස්තය දෙස බැලීමේ දී ඉතිහාස කථාවක් වශයෙන් පූජාවලිය ප්‍රමාණ කළ හැකිය.

එසේම මෙහි **බුද්ධ භක්තිය වර්ධනය කරනු පිණිස** නිරන්තර අවධානයක් යොමු කර ඇති බව හඳුනාගත හැකිය.

- මෙසේ තමන් වහන්සේට සංසාරයෙහි පක්ෂපාත කම් කළා වූ ස්ත්‍රීන්ට පවා මේ සා සත්කාරයක් දෙවාලූ හෙයිනුත් ඒ සත්කාර තමන් වහන්සේ ම ලදුවා නම් වන හෙයිනුත් මාගේ බුදුහු අර්හත් නම් වන සේක. **683 පිටුව**

- මෙසේ තමන් වහන්සේගේ ධාතු පරිනිර්වාණ දිනයෙහි පවා මේ සා මහත් වූ දිව්‍යපූජාවන් ලබන හෙයිනුත් එසේ වූ පූජා විඳීමට සුදුසු හෙයිනුත් මාගේ බුදුහු අර්හත් නම් වන සේකැයි දතයුතු. **737 පිටුව**

- මෙසේ මාගේ බුදුරජාණන් වහන්සේ මේ එක මිහිඳු මාහිමියන් වහන්සේ විසිනු දු කළා වූ ශ්‍රී ලංකාද්වීපයෙහි බුද්ධාණත්ති ප්‍රතිෂ්ඨා ය, බෝධි ප්‍රතිෂ්ඨා ය, ශාසන ප්‍රතිෂ්ඨා ය, සද්ධර්ම ප්‍රතිෂ්ඨා ය යි යනාදි වූ අප්‍රමාණ වූ ප්‍රතිපත්ති පූජා ලත් හෙයිනුත් නොකියන ලද අප්‍රමාණ වූ ස්ථවිරයන් විසින් කරන ලද අප්‍රමාණ වූ ප්‍රතිපත්ති පූජා ලත් හෙයිනුත් අර්හත් නම් වන සේක. **768 පිටුව**

සංසාර සාගරයට දිව්‍ය නෞකාවක් බඳු වූ, සංසාර නැමැති මහා පංක දූර්ගයට දිව්‍යසේතුවක් බඳු වූ සංසාර නැමැති මහා කාන්තාරයට දිව්‍ය රථයක් බඳු වූ සංසාර නමැති මහාන්ධකාරයට තෙජො කඳක් බඳු වූ සංසාර නමැති මහගිම් හෙලියට ඡායා වෘක්ෂයක් බඳු වූ, සංසාර නමැති පිපාසාවට පියුම් විලක් බඳු වූ.... මට ද සියලු සතුන්ට ද මවු වූ, පිය වූ, ගුරු වූ, දෙවි වූ, බඹ වූ, තමන් වහන්සේ වන් අමාමහ නිවන් පුරයෙහි සියලු සතුන් ගෙන හැර පුරා ගත්තා වූ අප මහා ගෞතම තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ඉතිපි සො භගවා..... **807 පිටුව**

**පුද්ගල මනෝභාවයන්හි ස්වභාවය දනවන අවස්ථා සඳහා 677, 678, 686, 692, 696, 723, 727 පිටු පරීක්ෂා කරන්න.**

**අද්භූත සිදුවීම් පරික්ෂා කිරීම සඳහා 31 වැනි පරිච්ඡේදයේ යශෝධරා තෙරණියගේ ප්‍රාතිහාර්ය පරික්ෂා කරන්න.**

# සද්ධර්මාලංකාරය

- පාලි භාෂාව නොදත් ලක්වාසී ජනතාවට අවබෝධ කළ හැකි භාෂාවකින් ඔවුන්ගේ සිත් පහදා ලෝකයටම යහපත වර්ධනය කරනු පිණිසත් බොහෝ කලක් පවතින ධර්ම ග්‍රන්ථයක් රචනා කිරීමේ අරමුණිනුත් සද්ධර්මාලංකාරය රචනා විණ.
- පරිච්ඡේද 24කින් සමන්විත මෙය වෛදේහ හිමියන් රචනා කළ පාලි රසවාහිනිය ආභාසය කොට ගත්තකි. එපමණකින් සෑහීමකට පත් නොවී මහාවංසය ඇතුළු කෘති ගණනාවක් පරිශීලනය කිරීමෙන් මෙම කෘතිය සම්පාදනය කර ඇත.
- මෙහි කර්තෘවරයා **දෙවන ධර්මකීර්ති** හෙවත් **දේවරක්ෂිත ජයබාහු ධර්මකීර්ති** හිමිපාණෝ ය. ඔහු **නිකාය සංග්‍රහය, ජිනාවබෝධාවලී** කෘති ද රචනා කර ඇත.
- මෙහි රචනා කාලය 1398- 1440 (14 වැනි සියවස), ගම්පල යුගය යි.
- මෙකල රචනා වූ අනෙකුත් කෘති වනුයේ : **දළදා පූජාවලිය, අත්තනගලු වංශය, මයුර සන්දේශය, තිසර සන්දේශය** ආදිය යි.

# සද්ධර්මාලංකාරය ලිවීමේ අරමුණු:

- **බෞද්ධ ජන සමාජය දිගුකලක් තිස්සේ කුසලයට නැඹුරු කිරීම**

  '' එතකුදු වුවත් ලෝවැඩ පිණිස බුදුන් විසින් වදාරණ ලද්දා වූ සද්ධර්මය මාගධී භාෂාවෙහි නොහසල සිංහල ද්වීප වාසීන්ට නොදැනෙන හෙයින් හෙළු බසින් පෙරළා ලංකාදීප වාසීන් වූ සාධු ජනයන්ගේ සිත් පහදවමින් ලෝවැඩ වඩා බොහෝ කාලයක් පවතින පරිද්දෙන්...''

- **ඔවුන්ගේ කුසල පක්ෂය පෝෂණය කොට අකුසලින් දුරු කරවීම**

  ''සාධු ජනයන්ගේ සිත් පහදවා ශ්‍රද්ධා බුද්ධි වර්ධනය කෙරෙමින් ඔවුන්ට ත්‍රිවිධ සම්පත් සාදා දෙනු පිණිස''

- **මානව සිත්හි ශ්‍රද්ධාව දියුණු කරලීම**
- **ගැඹුරු ජීවන අද්දැකීම් ලබා දීම**
- **ධර්ම ඥානය දියුණු කිරීම හා ජීවිතාවබෝධය ලබා දීම**

## කෘතිය රචනා කිරීමේ පෞද්ගලික අරමුණක් ද ඇත

"මතු බුදු වන බුදුන් දැක අෂ්ට ධර්ම සමෝධානයෙහි යෙදී විවරණ ශ්‍රී ලදිම් බුද්ධ කාරක ධර්මයන් මුහු කරවා ලොව්තුරා බුදුව මුළු ලොවට අභිවෘද්ධිය වෙම්වායි යන මාගේ අභිමත ප්‍රාර්ථනාව සාදා ගන්නා පිණිස"

## කෘතියෙන් විද්‍යමාන අනෙක් කරුණු:

- තත්කාලීන දේශපාලන තොරතුරු
- සමාජීය තොරතුරු
- ආගමික හා සංස්කෘතික තොරතුරු
- ආර්ථික තොරතුරු
- තත්කාලීන භාෂාවේ ස්වරූපය

## සද්ධර්මාලංකාරය:

- පරිච්ඡේද 24කි
- මෙහි **කතා වස්තු 155කි.**

"සූවිසි වර්ගයකින් හා සංශේප කතාවන් හා සමග අමෘත රස ධාරාවක් සේ සිටියා වූ එක්සිය පස්පනස් පමණ වස්තු කතායෙන් අලංකාර කොට සරසා"

- රසවාහිනියේ නැති අනෙක් කතා ගෙන ඇත්තේ,
    - යශෝධරා අපදාන
    - සූවිසි විවරණ
    - අනාගතවංශය
    - අවදානකල්පනාව
    - සොදත්තක නිදාන

යනාදි කෘති තුළිනි.

- දඹදිව **කතා** සහ **හෙළදිව කතා** ඇත
- හෙළදිව කතා **අනුරාධපුරය හා රුහුණ** කේන්ද්‍ර කොටගෙන ඇත
- පළමු පරිච්ඡේදයෙන් (ධර්මසංග්‍රහ වර්ගය) බුද්ධ නමස්කාරය කොට ඇත
- බණකතාවස්තු ආරම්භ වන්නේ තෙවැනි පරිච්ඡේදයේ සිට ය.
- කර්තෘවරයාගේ අරමුණ සාර්ථකත්වයට පත්ව ඇති අතර ඒ සඳහා ඔහු අනුගමනය කළ රචනා රීතිය බෙහෙවින්ම ඉවහල් වී ඇත. එහි දී ඔහු යොදාගත් රචනා උපක්‍රම අතිශයින්ම වැදගත් වේ.

# තේභාතික වර්ගය සහ බෝධිරාජ වර්ගය

**තේභාතික වර්ගය කථා 05කින් සමන්විත ය.**

- තේභාතික වස්තුව
- පුත්‍ර වස්තුව
- ස්වර්ණතිලකා වස්තුව
- බුද්ධෛනි වස්තුව
- කුණ්ඩලී වස්තුව

**බෝධිරාජ වර්ගය කථා 05කින් සමන්විත ය.**

- බෝධිරාජ වස්තුව (ලංකා ශාසන ප්‍රතිෂ්ඨාපන කථාව ද ඇතුළත්ව)
- ශ්‍රද්ධාසුමන වස්තුව
- ධම්මසවණෝපාසිකා වස්තුව
- කුඩ්ඩරජ්ජ වස්තුව
- මිගපෝතක වස්තුව

ආදි වර්ග දෙකට අයත් කථා ආශ්‍රය කොටගෙන කෘතිය පිළිබඳ විමර්ශනයක යෙදේ.

**ඉහතින් දැක්වූ පරිදි සද්ධර්මාලංකාරය කෘතිය ඇසුරින්,**

- **සද්ධර්මාලංකාර කතුවරයා ධර්ම ග්‍රන්ථය රචනා කිරීමේ දී පෑ සාමර්ථය ය (භාෂාව, රචනා උපක්‍රම ආදි සමස්ත වර්ණනා චාතුර්යය)**
- **කෘතියෙන් හෙළිවන ධර්ම උපදේශ**
- **කෘතියෙන් විද්‍යමාන තත්කාලීන සමාජ දේශපාලන ආගමික තොරතුරු**
- **කර්තෘවරයාගේ බුද්ධ භක්තිය**

ආදි දෑ පිළිබඳ මෙහි දැක්වේ. එමගින් සමස්ත කෘතිය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට හැකිවනු ඇත.

# සද්ධර්මාලංකාර කතුවරයාගේ රචනා රීතිය

තම කෘතිය රචනයේ දී ද්විතීය ධර්මකීර්ති හිමියන් ප්‍රකට කළ නිර්මාණාත්මක රචනා රීතිය අද්විතීය ය. දඹදෙණි යුගයේ විද්‍යාචක්‍රවර්තීන් බුත්සරණ රචනා කිරීමෙන් ද ධර්මසේන හිමියන් සද්ධර්මරත්නාවලිය රචනා කිරීමෙන් ද පළ කළ ප්‍රතිභාන්විත භාවය ගම්පොල යුගයේ දී සද්ධර්මාලංකාරය රචනා කිරීමෙන් දෙවන ධම්මකිත්ති හිමි පළ කළේ ය.

එහි දී උන්වහන්සේගේ භාෂා විලාශය හා භාවිත කළ රචනෝපක්‍රම පහත පරිද්දෙන් දැක්විය හැකිය.

# භාෂා විලාශය

## ❑ සංස්කෘත මිශ්‍ර භාෂාවක් භාවිත කිරීම.

තත්කාලීන සමාජීය භාෂාව යොදාගන්නා අතර **පණ්ඩිතප්‍රිය සංස්කෘත වදන්** අතරින් පතර ඇතුළත් කර ඇත.

- ඒ තොප ගේ චිත්ත සංකල්පනාව පුර පසළොස්වක් දිනයෙහි පඤ්චෝපක්ලේශයෙන් විනිර්මුක්ත ව අහස් මැද දිලිහෙන්නා වූ සොළොස් කලා පරිපූර්ණ චන්ද්‍රයා මෙන් සම්පූර්ණ වේවයි. ඒ ඒ තොප පැතූ සියල්ල ම නො ලස්වම සිද්ධ වේවයි. **(තේභාතික වස්තුව, 330 පිටුව)**

- සතරවැනිව අප මහා ගෞතම බුදුන් ගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් හා අසූඅනුබ්‍යඤ්ජන ලක්ෂණයෙන් විරාජමාන වූ අටළොස්රියන් බුද්ධ කාය මවාගෙන බෝමැඩ වජ්‍රාසන නැගී මාර පරාජයෙහි වැඩ හුන්නා වූ ශ්‍රී විලාසය දක්වාලීය. ඒ වේලෙහි ඔහු විසින් මවන ලද ඒ බුද්ධ වේශය සකල ශරීරය එක පැහැර සරහා සිටගත්තා වූ අසූඅනුබ්‍යඤ්ජන ලක්ෂණයෙන් ප්‍රතිමණ්ඩිත දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් සශ්‍රීක හෙයින් විකසිත පද්මෝත්පල පුණ්ඩරීකාදීන් ප්‍රතිමණ්ඩිත ජලතලාවක් මෙන් ද... **(තේභාතික වස්තුව, 342 පිටුව)**

❖ නොයෙක් සිය දහස් ගණන් විහාරාරාමයන් හා රත්රන් අමුරන් මුතු මැණික් ආදි වූ නානාප්‍රකාර සම්පත්ති සමූහයෙන් සමෘද්ධ වූ ඉසුරුමත් මහා ජනයාගෙන් ගැවසී ගත්තා වූ සත් රුවනින් විසිතුරු සොදුරු මනහර කොත් සමූහයෙන් බබළන්නා වූ මුදුන් කළුපෙළින් හා නානාප්‍රකාර විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන් ශෝභාමත් වූ දෙමහල් තුන්මහල්...(**ධම්මසවණොපාසිකා වස්තුව**, 416 පිටුව)

මේ අනුව කෘතියේ බොහෝ තැන්වලින් හමුවන්නේ සංස්කෘත භාෂාව මිශ්‍ර භාෂා විලාශයකි. එපමණක් නොව තද්භව කොට සකස් කරගත් වදන් ද බොහෝ සෙයින් දිස් වේ. ශෝතෘ ජනයාගේ විඩාව දුරු කරනු පිණිස ශබ්ද රසය ජනිත කරනු පිණිස එසේ පණ්ඩිතප්‍රිය භාෂාවක් භාවිත කළ බව සිතිය හැකිය.

## ❑ කෙටි වාක්‍ය හා දීර්ඝ වාක්‍ය භාවිතය

සමහර වැකිවල කෙටි බවක් දක්නට ඇති අතර තවත් තැනෙක දීර්ඝ වාක්‍ය භාවිත කොට ඇත.

- **කෙටි වාක්‍ය**

❖ ඒ ප්‍රත්‍යෙක බුද්ධවරයෝ නම් හිමවත ගන්ධමාදන පර්වතයෙහි වෙසෙති. හිස මුඩුය. කසාවස්ත්‍ර පෙරවගෙන කුලගෙවල භික්ෂාටනය කොට ඇවිදිති. ඉතා ශාන්තදාන්තයහ. සිල්වත් ගුණවත්යහ. (**තේභාතික වස්තුව**, 332 පිටුව)

❖ ඒ කුමාරිකාවන් සත් ඇවිරිදි කල්හි ඔවුන්ගේ මවුපිට දෙදෙන මිය පරලොව ගියහ. ඒ කුලයෙහි ඇති සියළු සම්පත්ම ඒ කුමාරිකාවන් සතු විය. ඒ සිටු කුමාරිකාවෝ වනාහි විශිෂ්ට වූ මනහර රූ ඇත්තීය. දුටුදුටුවන් ප්‍රසාද එලවන්නීය. උතුම් රූප සම්පත්තීන් යුක්තයහ. මනාවූ ඡවි පහස් ඇත්තාහ. දිව්‍යාප්සරාවක මෙන් සියළු අවයව සම්පත්තීන් ශෝභමානය. බැලූ බැලූවන්ට ප්‍රියකරු වන්නාහ. මන වඩන්නාහ. අචල වූ ශ්‍රද්ධා ඇතියහ. තුනුරුවන් කෙරෙහි පහන් සිත් ඇත්තාහ. (**බුද්ධෙනි වස්තුව**, 384 පිටුව)

## ▪ දීර්ඝ වාක්‍ය

- මෙසේ මෙකී රාජාර්ෂි මහිමයෙන් යුක්තව රාජ්‍යය කරන්නා වූ ඒ අශෝක රජ්ජුරුවෝ තුන් අවුරුද්දක් මුළුල්ලෙහි පළමු තමන්ගේ චන්ද්‍රගුප්ත නම් මුත්තනුවන් හා බින්දුසාර නම් වූ තමන්ගේ පිය මහ රජාණන් දවස පැවති පරිද්දෙන් ම බ්‍රාහ්මණයන් හා බ්‍රාහ්මණ ජාති ඇති පණ්ඩරංග පරිබ්‍රාජිකාදි වූ සැට දහසක් තීර්ථකයන්ට තමන් ඇතුළු රජගෙහිදී ම නිරන්තරයෙන් බත් දී උපස්ථාන කෙරෙමින් වැස, එක් දවසෙක සිවුමැදුරු කවුළුව සමීපයෙහි සිටියාහු නොසන් හුන් කාය වාක් සමාචාරයෙන් යුක්තව.... (**තේභාතික වස්තුව**, 335 පිටුව)
- මහත් වූ වීර්ය ඇති අනන්තඥානයෙන් යුක්ත වූ ස්වයම්භූඥානයෙන් සියල්ල ගෙවා දත්තා වූ මුළු ලොවට හිතාන්වෙසිවූ තුන්ලොවට අසහාය නායක වූ ලෝකස්වාමි වූ අනාථ නාථ වූ භාග්‍යවත් වූ ත්‍රෛලෝක්‍ය ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ උදෙසා දැන් මා විසින් පුදන ලද්දා වූ මේ මල් පූජාවෙහි අනුසසින් මතු සසර මම උපනුපන් ජාතියෙහි යහපත් රූ ඇති මෙව්වයි, මනෝඥ වූ ආරොහ පරිණාහයෙන් යුක්ත වෙම්ව යි ශරත් කාලයෙහි ගුවන් මැද දිලියෙන සූර්යය මණ්ඩලය පරිද්දෙන් මාගේ සියලඟින් රශ්මි මාලාවෝ විහිදෙත්වයි, මා දුටු.... (**ස්වර්ණතිලකා වස්තුව**, 375 පිටුව)

- **ගෞරවාර්ථයෙහි වාක්‍ය සංයෝජනය**

❖ ඒ බව දැක වෙළඳාණෝ අතිශයින් පහන් වූ සිත් ඇතිව ප්‍රාර්ථනා කරන්නාහු. 329

❖ එකල වැඩිමහළු වෙළඳාණෝ කිපී කියන්නාහු. 332

❖ සටවෙටිකාවෝ ඒ රජහට අසන්ධිමිත්‍රා නම් වූ බිසෝ වූහ. 332

❖ එවේලෙහි මහතෙරුන් වහන්සේ අපි රාක්ෂසයෝ නොවෙමු. 358

❖ ශ්‍රද්ධා සුමනාවෝ දෙමාපියන්ට නොකියා තමන්ගේ අභිප්‍රායෙන්ම ආ හෙයින් මෙපමණ දුක් අනුභව කළහ. 413

මෙවැනි තැන් කෘතියේ බොහෝ සෙයින් විද්‍යමාන ය.

- **උපමාවාචී වාක්‍ය නිර්මාණය**

❖ නිලුපුල කැකුලෙන් ගැවසී සිටගත් මහවිලක් සේ සරහමින් ප්‍රවාල සාගරයෙහි එකහෙලා පෙළෙහි දිවන රළපතර සමූහයක් මෙන් ඔදවැඩි පෙනෙමින් දිවගෙන අවුතත් වැදී ගියහ. එකල්හි අශෝක කුමාරයෝ ද යුද්ධයට සැරහී සිය සෙනග පිරිවරා සහස්‍රකිරණයා සේ මහත් වූ රාජ තේජසින් දිලිහි දිලිහී රණබෙර ගස්වා සිවුරඟ සෙනග මෙහෙයමින් මිහිමඬල මඬන්නාක් මෙන් දිවගෙන අවුත්... (**තේභාතික වස්තුව**, 333 පිටුව)

❖ විකසිත පද්මෝත්පල පුණ්ඩරීකාදීන් ප්‍රතිමණ්ඩිත ජලතලාවක් මෙන් ද තාරකා නිකරයන්ගේ රශ්මි සමූහ ස්පර්ශයෙන් විස්ඵුරිත වූ ගගන තලයක් මෙන් ද නීල පීත ලෝහිතාදි වූ ප්‍රභේද ඇති විචිත්‍රවර්ණ බුද්ධරශ්මි සමූහයෙන් වළඳනා ලද බ්‍යාමප්‍රභා පරික්ෂෙපයෙන් විරාජමාන විලාස ශ්‍රී ඇති හෙයින් සන්ධ්‍යා ඝන ප්‍රභානුරාග ඉන්ද්‍රචාප විද්‍යුල්ලතා ආදියෙන් පරික්ෂිප්තව තරුණ රවි කිරණින් දිලියෙන කනක ගිරි සිඛරයක් මෙන් ද නානා විරාග විමල කෙතුමාලාලංකාරයෙන් සමුජ්වලිත වූ මනහර සිරොධාතු ශෝභාවකින් යුක්තව... (**තේභාතික වස්තුව**, 343 පිටුව)

නාරජහු වසන ආරාවාල නම් විලට වැඩ ඉඳුනිල්මිණි ගල්තලක් මත්තෙහි සක්මන් කරන්නා සේ සියපිට සක්මන් කරන සේක. (**තේභාතික වස්තුව**, 354 පිටුව)

දේවයන් වහන්ස, ඉතා රූපත් වූ දෙවඟනක හා සමාන එක් කුමාරිකාවක දවස තුන් විටෙක අසෙකු නැඟී බෝමැඩ කරා අවුත් සතුටුව ශ්‍රී මහාබෝධීන් වහන්සේ වැඳ විදුලිය කළඹක් මෙන් බබළමින් යන්නීය. ඒ කුමාරිකාවන්ගේ රූප ශ්‍රී වෙන වර්ණනා කොට කිය නොහැක්ක. තමලු ලිය සිරි පරදවන අක්බඹරු වූ නිල් සිනිඳු කෙස්වැටියක් ඇතියහ. රණෝවිලි පරදවන විදුලි දෙකක් වැනි කන්වැල සඟළක් ඇතියහ. රන් හංස පැටවුන් දෙදෙනෙක් වැනි මනෝඥ වූ තන සඟලක් ඇතියහ. චන්ද්‍රකාන්තිය හා මිශ්‍ර වූ සන්ධ්‍යා වලා පටලයක් මෙන් අති ධවල දන්ත රශ්මීන් භින්නවර්ණ වූ සුරක්තවර තොල් සඟළක් ඇතියහ, රන් අකුස්සන් වැනි අගින් උස් වූ නාසිකාවක් ඇතියහ, පරවියන්ගේ බැම මෙන් නිබ්ම පත්‍රාකාරව බබළන්නා වූ සිත්කළු වූ බැමසඟළක් ඇතියහ, මඳ මඳ සිනා පෙරදැරිව කියන්නා වූ ළඳ බොළඳ වචනයෙන්ම දුටු දුටුවන් සිත් පිණවන්නාහ. (**බෝධිරාජ වස්තුව**, 397-398 පිටු)

- **නාට්‍යෝචිත අවස්ථා බහුලව දක්නට ලැබීම**

❖ "මහරජ මේ කිනම් ගසෙක් දැ"යි විචාල සේක. රජ්ජුරුවෝ "ස්වාමීනි, අඹ ගසය"යි කීහ. මහරජ මේ අඹගස ඇර තවත් අඹගස් ඇත්දැයි විචාල සේක. රජ්ජුරුවෝ එසේය ස්වාමීනි, බොහෝවනැයි කීහ. අඹගස් ඇර අන් සෙසු ගස් ඇද්දැයි විචාලසේක. ස්වාමීනි, අඹගසින් පිටත් සෙසු ගස් පමණ නැතැයි කීහ.... (**තේභාතික වස්තුව**, 361 පිටුව)

❖ "එම්බා දියණියනි, මේ සිටි අසුන් අතුරෙන් තොපට අභිප්‍රාය වූ සිතවන් අසෙකු තෝරා ඇර ගන්වයි" කීහ. එවේලෙහි ඒ සිටු දියණියෝ එතැන්හි සිටියා වූ අසුන් මු¨ල්ලම පරික්ෂා කරන්නාහු එක් සෛන්ධව අස්පැටවෙකු දැක "මොහු මට දුන මැනවැයි"කීහ. එවෙලෙහි වෙළඳාණෝ කියන්නාහු "එම්බා දියණියනි, මේ තෙම සෛන්ධව කුලයෙහි උපන් බලසම්පන්න අස් පැටවෙක. එබැවින් මොහු අප්‍රමාදිව පෝෂණය කරවයි" කියා...(**බුද්ධෙනි වස්තුව**, 386 පිටුව)

- **අද්භූත රස ජනනය වන අවස්ථා බහුල ලෙස යෙදීම**

❖ මහ තෙරුන් වහන්සේ ද යම් යම් කර්මාන්තයෙක් නො නිමා නම් ඒ ඒ කර්මාන්තය තමන් වහන්සේගේ ආනුභාවයෙන් වහා සමෘද්ධ කරවන සේක. (**තේභාතික වස්තුව**, 343 පිටුව)

❖ සැබැවින්ම මම තුනුරුවන් කෙරෙහි පහන් සිත් ඇතිවෙම් වීම් නම් මෙ මට සැබෑ ශ්‍රද්ධාවක් ඇත්නම් මේ ඇකිල්ල වහා දිව ගෙන ගොස් ඒ මහාකාළ නම් නා රජහු බදා ගෙනවයි'යි සත්‍යක්‍රියා කොට තමන්ගේ තෙජෝ ගුණය ද සලකා බිමට දැමූහ. එකෙණෙහි ඒ ඇකිල්ල කිසි පැකිලීමක් නැතිව මහ පොළොව දෙබෙ කෙරෙමින් ඇසිල්ලක දිව ගෙණ ගොස් ඒ මහාකාළ නම් නා රජහු පැහැර හින. (**තේභාතික වස්තුව**, 341 පිටුව)

- එ වේලෙහි  සක්දෙව් රජ් මහරජ චාරිකාවෙහි හැසිරෙණුයේ එපවත් දැක විශ්වකර්ම දිව්‍යපුත්‍රයා කැඳවා "එම්බා දරුව, ධර්මාශෝක රජ්ජුරුවෝ ධාතු නිධානය උගුළුවා ධාතූන් වහන්සේ ගෙන පූජා සත්කාර කෙරෙමියි පිටත උලු සුණු බිඳවා ඇතුළට බටුවාහු තොප විසින් යොදන ලද යන්ත්‍ර රූපයෙහි ආනුභාවයෙන් වැද්ද නොහී සිටියාහ. දැන් තෙපි වහාම ඔබ ගොස් ඒ යන්ත්‍රය උගුළුවා පියව"යි නියෝග කෙළේය. (**තේභාතික වස්තුව**, 345 පිටුව)

- තවද සමුද්‍රයෙන් අනෙකවිධ වූ මුතු ජාතීහු ද පහළ වූහ. ඒ කවර මුතු ජාතීහුද යත්? ඇළි අසුන් ගේ ආකාර ඇති අශ්වනම් මුතුය, ඇළි ඇතුන්ගේ ආකාරය ඇති ගජ නම් මුතුය, එසේම රථ චක්‍රාකාර ඇති රථ නම් මුතුය, ඇඹුල ඵලාකාර ඇති අම්ලකී නම් මුතුය....(**තේභාතික වස්තුව**, 352 පිටුව)

- ඉක්බිති ඔහු ඒ මාණික්‍ය රත්නය සුදු අතුට සරහන ලද පිරිසිදු ආසනයක් මත්තෙහි තබා මල් පහන් සඳුන් සුවඳ ආදිය පුදා සත්කාර කොට අපට වස්තු දුන මැනවැයි ආරාධනා කොට මාණික්‍ය රත්නයට පැන් ඉස්සාහ. ඔවුන් කැමැති කැමැති වස්තු සියල්ලම ඉන්ද්‍රජාලයක් මෙන් එකෙණෙහි නිර්මිතව පෙණී ගියහ. (**තේභාතික වස්තුව**, 374 පිටුව)

## ▪ සංකල්ප රූප ජනනය වන අවස්ථා බහුලව යෙදීම

❖ එකල දෙකන් අගුලු එලන්නා සේ ඒ ඒ දිග්භාගයෙන් මහ සුළඟ හමන්නට වන. හාත්පසින් මහ රුක්මුලිනිදිර කදුපතර වෙන වෙන බිදිබිදී උඩ නැඟී අහස් කුස බමා බස්නට වන. අවට සිටි මහගල් කුළු බිඳගෙන සතර දිගින් ගුගුරා දිවන්නට වන. දශදිශාන්තරය එක පැහැර අඳුරු කෙරෙමින් සිය ගණන් මහ මේකුළු නගා ආකාශය ගුගුරන්නට පටන් ගත. දශදිග මහත් ගිනිසුළු ගසන්නා සේ එක පැහැර විදුලිය කැල නික්මෙන්නට වන. දෙකන් බිහිරි කරන්නා සේ මහත් ගර්ජනා කෙරෙමින් ඒ ඒ තන්හි දහස් ගණන් සෙන ගසන්නට වන. එදවස් ආකාශ කුහරය බි÷නාක් මෙන් අනවකාශව තල් පොල් කඳ පමණ මහත් ජලධාරාවෝ වස්නට වන්හ. (**තේභාතික වස්තුව**, 354 පිටුව)

❖ ස්වර්ණතිලකා තොමෝ උද්දාල බ්‍රාහ්මණයාණෝ නම් කවුරුදැයි විචාරා තෙල භද්‍රපීඨය මත්තෙහි හිඳිනාහු ඒ බ්‍රාහ්මණයාණෝ යයි කී කල්හි තමාගේ නිලුපුල් පෙති දෙකක් හා සසමාන නිර්මල වූ සුනිල් නෙතින් ඔහු බලන්නී, කොඳ කැකුළු මෙන් සුදු සිනිදු දත් පෙළෙහි මනහර සුදු රැසින් භින්න වූ වර්ණ වූ අතිරක්ත රධර යුග්මය පොපි දෙවා මඳ සිනා පහළ කෙරෙමින් උද්දාල බ්‍රහ්මණයා මුහුණ බලා තමා පෙරව ගෙන උන් පළස මඳක් පහ කොට ශරීරප්‍රභා විහිදුවාලූහ. හිරුරැස් කළඹක් වැනි වූ ශරීරාලෝකය දැක (**ස්වර්ණතිලකා වස්තුව**, 381 පිටුව)

## ▪ කරුණ සමෘද්ධ කිරීම පිණිස ගාථා ඇතුළත් කිරීම

බොහෝ විට මෙකී ක්‍රමවේදයට අනුගත වී ඇති බව හඳුනාගත හැකිය. ශ්‍රාවකයාගේ මහන්සිය දුරු කරනු වස් යෙදූ බවත් පෙනේ. කරුණ වහා අවබෝධ කරනු පිණිස යෙදූ බවත් සිතිය හැකිය. රසවාහිනියෙන්, මහාවංසයෙන් ගත් අවස්ථා බහුලව ඇත.

ලලනානනානී වලලොචනානි
තරුණාරුණානී චලිතාධරානි,
මනුජො හි යො නෙත්තපියං කරොති
සතු නීචජාතිමපි නො ජහාතී

(**ස්වර්ණතිලකාගේ රූපශ්‍රීය වර්ණනා කිරීම**, 378 පිටුව)

පියතො ජායතී සොකො - පියතෝ ජායතී භයං

පියතො විප්පමුත්තස්ස - නත්ථි සොකො කුතො භයං (කාමයන්ගෙන් වන අවැඩ)

බොහෝ ගාථා යොදා ඇත. ඒවා පරීක්ෂා කරන්න.

මේ ආදි වශයෙන් කර්තෘවරයා කෘතිය රචනා කිරීමෙහි දි පෑ සාමර්ථය හඳුනාගත හැකිය.

# කර්තෘවරයාගේ මූලික අපේක්ෂාව ධර්ම උපදේශ ලබාදීමය

සද්ධර්මයේ අලංකාරවත් බව ප්‍රකාශ කරනු පිණිස රචිත මෙහි මුඛ්‍ය අරමුණ සත්පුරුෂ ජනයින් ධර්ම මාර්ගයට යොමු කිරීම බව හඳුනාගත හැකිය. කර්මය, කර්මඵල පිළිබඳ දක්වමින් යහපත කළ කල්හි සැප ද අයහපත් දෑ කළ කල්හි දුක ද උරුමවන බව බොහෝ තන්හි පෙන්වා දී ඇත. ඔබගේ නිර්දිෂ්ට කොටසෙහි එවැනි අවස්ථා දැකගත හැකිය.

මෙහි කර්මය හා කර්මඵලය මැනවින් දක්වා ඇත.

## 01. කර්මය

❖ දැන් මේ පාත්‍රය පුරවා මී දන් දුන්නා වූ කුශලයෙන් මතු මම දස දහසක් යොදුන් දඹදිව් තෙලෙහි ඒකච්ඡත්‍ර නංවා රාජ්‍යය කෙරෙම්වයි පාත්‍රය පිරි මුවවිටින් ඉතිර මී උඩ නැගි පරිද්දෙන් ම මාගේ ආඥාව උසස්ව නැගී අහසින් යොදුනක් පවතීවයි.... *329-330 පිටු*

## විපාකය

❖ යටකී පරිද්දෙන් මී දන් දුන් බාල වෙළඳාණෝ දෙව්ලොව ඉපිද මහත් වූ දිව්‍ය සම්පත් විඳ එයින් චුතව පැළලුප් නැවර බින්දුසාර නම් රජහට පුත්ව උපන්හ. *332 පිටුව*

## 02. කර්මය

එකල වැඩිමහලු වෙළඳාණෝ කිපී කියන්නාහු "එම්බල, බ්‍රාහ්මණ චණ්ඩාලයෝත් කසාවස්ත්‍ර පෙරවගෙන ඇවිදින්නාහුමය. එබැවින් තොප අතින් මී දන් ගත්තේ චණ්ඩාලයෙකැයි සිතමි"යි කීහ. *332 පිටුව*

## විපාකය

බිසෝ කෙනෙකුන් කුස පිළිසිඳ පවා පළමු වෙළඳාව උපන් ජාතියෙහි පසේ බුදුන්ට චණ්ඩාල වාදයෙන් ආක්‍රෝශ කළා වූ අකුශල බලයෙන් උපදනා දවස් චණ්ඩාලයන් වසන සැඩොල් ගම් මැද නුගගසක් මුල ශාලාවෙක අනාථව උපන් සේක. *340 පිටුව*

## 03. කර්මය

ඒ අසා කුමාරිකාවෝ මෑණියන්ට කිපී "චණ්ඩාල කෙළි නම් තෙපි මය"යි කියා තමන් මෑණියන්ට බිණූහ. *376 පිටුව*

## විපාකය

ඒ කුමාරිකාවෝ යම් ක්‍රෝධයක් හේතු කොට ගෙණ තමන් වැදූ මෑණියන්ට චණ්ඩාල කෙල්ලැයි බිණුවාහු ද? ඒ අකුශල කර්මය නිසා උත්තම ජනයන් විසින් පිළිකුල් කටයුත්තා වූ හීන ජාතියෙහි චණ්ඩාලව උපන්හ. *376 පිටුව*

**එපමණක් ම නොව ධර්ම මාර්ගයට යොමු කරනු වස් හා ධර්මය පිළිබඳ අවබෝධය ලබාදෙනු වස් ගත් උත්සාහය හඳුනාගත හැකිය.**

- මහේශාක්‍ය වූ මහානුභාව සම්පන්න පසේ බුදුවරුන් වහන්සේට එසේ නොබිණුව මැනව. සිල්වතුන් වහන්සේට ආක්‍රෝශ පරිභව බිණුවාහු මතු අපායෙහි ඉපිද මහත් දුක් විඳිනාහ. **332 පිටුව**
- පළමු පින් කරන ජාතියෙහි පසේ බුදුන්ට මී පිළ දැක්වූ ස්ත්‍රී තොමෝ එකල්හි රජකුලයෙහි ඉපිද දෙවඟනක් මෙන් දිලිහෙන රූප ශ්‍රී ඇතිව සොළොස් දහසක් බිසෝවරුන්ට නායක අසන්ධිමිත්‍රා නම් වූ අග්‍ර මහේසිකා වූවා... **334 පිටුව**

- මෙසේ දවසින් දවස වඩ වඩා තුණුරුවන් කෙරෙහි අතිප්‍රසන්නව කුශල ධර්මය පිරීමෙන් ධර්මාශෝක යයි ප්‍රසිද්ධව පින් රැස් කරන්නා වූ රජ්ජුරුවෝ... **343 පිටුව**
- හැම දෙනම නොලස්ව දඹදිව් තෙලෙහි ඇති ගම් නියම්ගම් රාජධානීන් හා සියළු මාර්ග දිශාන්තරයන් එක පැහැර නානාලංකාරයෙන් සරහාලව යොදනින් යොදනෙහි දැන්සැල් කරවා මහදන් පවත්වා ලව, ඒ ඒ විහාරවල වැඩවසන මහා සංඝයා වහන්සේට තම තමා ශක්ති පමණින් මහදන් පවත්වා උපස්ථාන කරව, හැම තන්හි අතුරු නොහැර ඇගෑ බඳවා පහන් පූජා කරන, නානා ජාතියෙහි සුවඳ මල් ගෙන හැර පුදව... **346 පිටුව**
- කිසි කෙණෙකුන් කෙරෙහි ක්‍රෝධ නොකරව මනුෂ්‍යයන් තමන්ගේ ප්‍රාණරක්ෂා පිණිස මහොත්සාහයෙන් ඇති කොටගත් ශෂ්‍යජාතයන් නොනසව. සියල්ල වුන් කෙරෙහි මෛත්‍රී කරව, යනාදින් අවවාද කළ සේක. **355 පිටුව**

- තමනට වැඩ කැමති පින්වත් සත්වයන් විසින් සිල්වතුන් විෂයෙහි අනාදර නොබැණ තුණුරුවන් ගුණ නුවණින් සලකා ශ්‍රද්ධා සම්පත්තීන් යෙදි කුසල් කොට මතු ස්වර්ග මෝක්ෂ සම්පත් සිද්ධ කරන්නට උත්සාහ කළ මැනවි. **371 පිටුව** (තේභාතික වස්තුව)
- තමන්ගේ දරුවන් මැරුවාහු මෙම ජාතියෙහි බොහෝ අපකීර්ති අසා සියල්ලවුන් විසින් කරනු ලබන නින්දාවට පැමිණෙන්නාහ. තවද එම ප්‍රාණාතිපාතය කළා වූ අකුසලයෙන් මතු ඒකාන්තයෙන් බොහෝ දුක් විඳින්නාහුමය. (පුත්‍ර වස්තුව, **352** පිටුව)
- මෙසේ මනුෂ්‍ය ලෝකයෙහි සමහර ශ්‍රද්ධාවත් සත්වයෝ තමන් වැදූ දරුවන් කෙරෙහි පවා ප්‍රේමය සිඳ හැරපියා මතු ලබන්නාවූ ස්වර්ග මොක්ෂ පිණිස දන් දෙන්නාහුමය. **375** පිටුව

- ඒ ඒ මනාප වස්තුයෙහි ප්‍රිය වීමය, තෘෂ්ණා වීමය යි යන මේ පසින් එක්තරා කාරණයක් මුල්ව ශරීර ශොසනය කරන්නා වූ සොකය ද, කායචිත්ත සන්තාප කරන්නා වූ භය ද යන මේ දෙකම සත්වයන්ට උපදනේය. (**ස්වර්ණතිලකා වස්තුව**, 380 පිටුව, *කාමයන්ගේ ආදිනව* පෙන්වා දිම)
- "නුවණ පෙරදැරිව කුසල් කරන්නා වූ පින්වත් සත්වයෙනි, බුදු පසේබුදු මහ සවුවන් විසින් වර්ණනීය වූ නිවන් පුර සිරි පතාම කුසල් කළ මැනවි" 384 පිටුව
- එබැවින් සරණ පිණිස පති කුලයට යාමෙන් මට ප්‍රයෝජන කිම්ද? හෙද වනාහි හුදක් වස්තු විනාශයටම කාරණා වන්නේය. දැන් මා විසින් මේ සියළු වස්තු රාශියම දන් පින් කිරීම් වශයෙන් බුද්ධ ශාසනයෙහි නිධාන කොට තිබීම යහපත් වන්නේය. (**බුද්ධෙනි වස්තුව**, 385 පිටුව)

- සාමණේරයන් වහන්සේ සමීපයට අවුත් නගුට සලමින් සාදර දක්වා මුහුණ බල බලා සිටියාය. සාමණේරයන් වහන්සේ බැල්ල දැක කම්පිත වූ සිත් ඇතිව තමන් වහන්සේ වළඳන්නට පළමුවෙන් අතට ගත් බත් ආලෝපය බැල්ල ඉදිරියේ තබාලූ සේක. එකල්හි බැල්ල සතුටුව ඒ බත්පිඩ අනුභව කළාය. එපවත් දැක සතුටු වූ සාමණේරයන් වහන්සේ විටින් විට බත්පිඬු වටවටා ඒ බත් සියල්ලම බැල්ලට දන් දී පාත්‍රය සොධා දිය සිඳ පසුම්බියෙහි බහා බැඳගෙන වැඩි සේක. (**කුණ්ඩලී වස්තුව**, 390 පිටුව)
- ඒ උපාසිකා තොමෝ තමා පුතු දෂ්ට කරන්නා වූ සර්පයා දැක කිසියක්හට මෙපවත් කීම් නම් මාගේ බණ ඇසීම අන්තරාය වෙයි. දරුවෝ දුර්ලභ නොවෙති, කප් අසංඛ්‍යයකිනුත් බුදු කෙණෙකුන් වහන්සේ ලොව පහළවීම දුර්ලභ හෙයින් බුද්ධෝත්පාද දර්ශනය අති දුර්ලභය, බණ ඇසීම ද එපරිද්දෙන් දුර්ලභය. (**ධම්මසවණොපාසිකා වස්තුව**, 417 පිටුව)

- කර දික්කොට උඩුකුරු කරන ලද කන්තල ඇතිව එසවූ දකුණු පය බිම නොතබාම ධර්ම කථිකයන් වහන්සේගේ කණ්ඨස්වරයෙහි නිමිත්ත ග්‍රහණය කොට නිශ්චලව සිටියේය. එකෙණෙහි වැදි පුත්‍රයා ඔහු එක ශර ප්‍රහාරයෙන්ම විද ජීවිතක්ෂයට පමුණුවාපීය. ඉක්බිති ඒ මුවා කාලක්‍රියා කොට එම වෙහෙර වසන අභය නම් මහතෙරුන් වහන්සේගේ නැගණියන් කුස පිළිසිඳ ගෙන...
  (**මිගපොතක වස්තුව**, 423 පිටුව)

මේ ආකාරයෙන් ධර්මය ශ්‍රවණය කිරීම, යහපත සඳහා කටයුතු කිරීම, අනුන් යහපතෙහි යෙදවීම, කුසල් කිරීම, අකුසල් නොකිරීම ආදි වැදගත් ධර්ම උපදේශයන් අතොරක් නැතිව ලබාදෙන බැව් පැහැදිලි ය. එබැවින් මෙය ධර්ම ග්‍රන්ථයක් වශයෙන් ප්‍රමාණ කළ හැකිය.

# තත්කාලීන සමාජ දේශපාලන විවරණයක් නිරූපණය කරයි

මෙහි ජම්බුද්දීපුප්පත්ති කතා සහ ලංකාදීපුප්පත්ති කතා යනුයෙන් කතා කාණ්ඩ දෙකකි. මේ කොටස් දෙකෙන්ම භාරතීය සමාජය, දෙශපාලන පසුබිම මෙන්ම ලාංකේය සමාජ දේශපාලන පසුබිම කෙබඳු ස්වරූපයක් ගත්තේ දැයි හඳුනාගත හැකිය.

**දේශපාලන තොරතුරු අන්තර්ගත වීම (භාරතීය සමාජය)**

මෙහි තෛභාතික වස්තුවෙන් භාරතීය දේශපාලනයේ අතීත අවස්ථාවක් පුනරාවර්ජනය කරයි. එනම් අශෝක රජුගේ ප්‍රවෘත්තිය යි.

- ❖ එකල ඒ රාජ කුමාරයන්ගේ මුහුණ ඔප් නැගූ රන් කැඩපතක් මෙන් සියල්ලවුන්ට පියකරුව බබළන හෙයින් පියදාස කුමාර යයි නම් තුබූහ. **332 පිටුව**
- ❖ පියදාස නස් පුතණුවන්ට අවන්ති රට උදේනි නුවර රාජ්‍ය දි යවූහ. එකල්හි ඒ පියදාස නම් කුමාරයෝ උදේනි නුවරට යන්නාහු අතරමග වෙටිස නම් නුව ලැගුම්ගෙන ඒ නුව සිටාණන්ගේ වෙටිසදෙවි නම් දියනියන් තමන්ට අගබිසෝ තනතුරෙහි පිහිටුවා කැඳවාගෙන ගොසින්... **333 පිටුව**

❖ යුවරජ තනතුරෙහි සිටි වෙන මවුන් දරු සුමන නම් වූ වැඩිමහල් රාජකුමාරයෝ කිපී අද මරණ හෝ වුව මැනව රාජ්‍යය හෝ ගතමැනවැයි වහසි බැණ තමන්ට වසඟව සිටි අටානූවක් මල් රජකුමරුවන් පිරිවරා තරු පිරිවරූ චන්ද්‍රයා සේ දිලිහෙමින් මහසෙනග රැස්කරවා වෙන වෙන අතින් ගෙන උඩුකුරු කරන ලද ආයුධ සමූහයෙන් මුළු නුවර නිළුපුල කැකුලෙන් ගැවසී සිටගත් මහවිලක් සේ සරහමින් ප්‍රවාල සාගරයෙහි එකහෙලා.... එක කුසෙහි ඔත් තිස්ස නම් රාජකුමාරයන් හැර සෙසු අට අනූවක් මල් රාජකුමාරවරුන් ද මරවාපීය. එතැන් පටන් ඒ අශෝක කුමාරයෝ චණ්ඩාශෝක යයි තුන්වන නාමයකින් ප්‍රසිද්ධ වූහ. **333 පිටුව**

❖ දවසින් දවස වඩ වඩා තුණුරුවන් කෙරෙහි අති ප්‍රසන්නව කුශල ධර්මය පිරීමෙන් ධර්මාශෝක යයි ප්‍රසිද්ධව පින් රැස් කරන්නාවූ රජ්ජුරුවෝ තමන් ඔටුනු පළන් එම සතර වන අවුරුද්දෙහි එක් දවසෙක අශෝකාරාමයෙහි වැඩ වසන සැටදහසක් භික්ෂූන් වහන්සේට පාසිවුරු... **343 පිටුව**

***ගම්වලින් අයබදු එකතු කළ බව මෙන්ම අධිකරණ ශාලාවක් තිබුණු බව සඳහන් ය. ඒ අනුව එකල සමාජයේ විවිධ විෂම වෘත්තීන්හි යෙදුණු අය සිටි බව හැඳිනගත හැකිය.***

- එකල්හි දස දහසක් යොදුන් දඹදිව සුවාසූ දහසක් රාජධානියෙන් හා සපණසක් රුවන් ආකරයෙන් හා නවානූ දහසක් ද්‍රොණමුඛයෙන් හා සයානූ කෙළ ලක්ෂයක් පටුන් ගම්වලින් හා දවස් පතා නික්මුණා වූ අය හැර එම පැළඹප් නුවර සතරවාසල් දොරින් සාරලක්ෂයක් හා නුවර මැද අධිකරණ ශාලාවෙන් ලක්ෂයක් හා මෙසේ දවස් පතා පස් ලක්ෂයක් ධන උපදනේය.

*භාරතීය දේශපාලනය රාජාණ්ඩු පාලනයක් විය. එනිසා රාජ්‍යාවලිය පියපුතු පරම්පරාව අනුව ගිය බව හඳුනාගත හැකි වැදගත් සාධකයකි.*

## සමාජ තත්ත්වය නිරූපණය කිරීම (භාරතීය සමාජය)

- රජ්ජුරු කෙනෙකුන් දාව බිසෝ කෙණෙකුන් කුස පිළිසිඳ පවා පළමු වෙළඳාව උපන් ජාතියෙහි.... චණ්ඩාලයන් වසන සැඩොල් ගම් මැද නුගගසක් මුල ශාලාවෙක අනාථව උපන් සේක. (340 පිටුව)

***මෙකල භාරතයෙහි සැඩොළුන්ට ජීවත්වීම සඳහා වෙනම ප්‍රදේශයක් වෙන්කර තිබූ බව මෙයින් පැහැදිලි වේ. එසේම ඔවුන් පහත් කුලයක් සේ සැලකූ බව මෙයින් හඳුනාගත හැකිය.***

- යටගිය දවස දඹදිව බරණැස් නුවර වෙළඳ තුන් බෑ කෙණෙක් මී වෙළඳාම් කෙරෙමින් තම තමන්ගේ අඹුදරුවන් හා සමග ජීවත්ව වෙසෙති. 329 පිටුව

***වෙළඳ ව්‍යාපාර කටයුතු පූර්වයේ පටන් භාරතයේ තිබී ඇති බව පැහැදිලි ය. එසේම ඒ ඒ කර්මාන්ත අනුව වීථි වෙන්කර තිබූ බව ද යට සඳහන් උද්ධෘතයෙන් සනාථ වේ.***

- එතෙපුල් අසා ඒ ස්ත්‍රී තොමෝ මී තිබෙන පිළ පෙණෙන තෙන සිට අත දික් කොට "ස්වාමීනි, තෙල ඉදිරියෙහි පෙණෙන්නේ මී විකුණන පිළ ය"යි දක්වා... 329 පිටුව

***තෙරුවන් සරණ ගිය පිරිසක් සිටි බොහෝ කථා ප්‍රවෘත්තිවලින් හැඳිනගත හැකිය. ඒ අනුව දිවි සාදාගත් අය රාශියක් මෙහිදි දැකිය හැකිය.***

- මන වඩන්නාහ. අචල ශ්‍රද්ධ ඇතියහ. තුනුරුවන් කෙරෙහි පහන් සිත් ඇත්තාහ. (බුද්ධෙනි වස්තුව, 384 පිටුව)

- **දේශපාලන තත්ත්වය නිරූපණය කිරීම**

***පෙර මී මධු පූජා කළ අවස්ථාවෙහි කුඩා මළණුවන්ට දොස් කී පාපයෙන් ලංකාවේ උපත ලැබූයේ දේවානම්පියතිස්ස රජු ය.***

පළමු මී දන් දෙන සමයෙහි මැදි බෑ වෙළෙඳාණෝ වනාහි පසේ බුදුන් මුහුදින් එතර දමා පියවයි කී අකුශලයෙන් දඹදිව ඉපද ගතනොහී මුහුදින් මෙතර ලංකාද්වීපයෙහි අනුරාධපුර නුවර මුටසීව නම් රජහට දෙවන පෑතිස් නම් පුත්ව උපන්හ. 351 පිටුව

***දේවානම්පියතිස්ස රජුගේ සහෝදරයන්ගේ නාම අන්තර්ගතව තිබේ.***

අභයරාජ කුමාරය, දෙවනපෑතිස්සය, මහානාගය, උත්තිය, මත්තාභය, සූරතිස්සය යනාදි දස බෑ රජ කුමාරවරුන්ගෙන් එම දෙවනපෑතිස් කුමාරයන් ඔටුණු පළඳවා රාජ්‍යයෙහි පිහිටුවූහ. 351 පිටුව

## ධර්මාශෝක රජු හා සමීපව ඇසුරු කළ බව හැඟවීම

එම්බා රජ්ජුරුවෙනි, මම බුදුන්ගේ ධර්මය අසා බුද්ධ රත්නය, ධර්ම රත්නය, සංඝරත්නය යන මේ තුණුරුවන් සරණ ගෙන උපාසක වීමි. එසේ හෙයින් පින්වත් රජ්ජුරුවෙනි, තෙපිත් මා සේම උතුම් වූ තුණුරුවන් කෙරෙහි පැහැද සැදැහැයෙන් තිසරණ ගෙන උපාසකව කුශල ධර්මයෙහි යෙදි වාසය කරව... 353 පිටුව

## බුදුදහම ලැබීමේ පුවත

❖ අප බුදුන් පිරිනිවී දෙසිය සතිස් වන හවුරුදු ධර්මාශෝක රජහට අටළොස් වැන්නෙහි දෙවනපැතිස් රජහට පළමු වැන්නෙහි එම මිහිඳු මහ තෙරුන් වහන්සේ උපසම්පදා වූ දොළොස්වන අවුරුදු පොසොන් පුර මුල නැකත ලද පසළොස්වක දවස ය.... 360 පිටුව (මහින්දාගමනයේ සියළු තොරතුරු අන්තර්ගත ය.)

***බුදුසසුන විෂයයෙහි දේවානම්පියතිස්ස රජු කැපවූ බව***

- එකල මහමෙවුනා උයන්හි මිහිදු මහ තෙරුන් වහන්සේට ආදිකොට කැර වූ තිස්සමහාරාම නම් වූ මහාපායෙහි බිම් බිත්ති තෙත් හෙයින් ගිනිසිළු පැපෑ වියලූහ.... තවද රජ්ජුරුවෝ මහාබෝධිස්ථානය, ලොවා මහා ප්‍රාසාදස්ථානය යන මේ දෙතැන්හි මහත් වූ ශාලා දෙකක් කරවා.... බොහෝ පිරිවෙන් හා රාත්‍රි ස්ථාන, දිවාස්ථාන, සක්මන් මණ්ඩප, පොකුණු, පතැස් ආදි වූ නොයෙක් විහාර වින්‍යාස කරවූහ... 365 පිටුව

***තව ද ලංකා ශාසන ප්‍රතිෂ්ඨාපන කථාහි දි සිංහල ජාතිය ආරම්භ වීම හා ව්‍යාප්ත වීම පිළිබඳවත් බුද්ධසාසනය මෙහි පිහිටි ආකාරයත් පිළිබඳව අන්තර්ගත වේ.***

# සමාජ තත්ත්වය

***ආගමික භක්තියකින් හෙබි ජනතාවක් විසූ බව හැඟවෙන කථා ප්‍රවෘත්ති අන්තර්ගත ය.***

- ස්වර්ණතිලකා කතාපුවත ඉදිරිපත් වන්නේ වළගම්බා රාජ්‍ය සමයට පසු බව අභයගිරි වෙහෙර ගැන සඳහන් වීමෙන් පෙනී යයි. ඇය ශ්‍රද්ධාවත් කාන්තාවකි. (ලංකාද්වීපයේ අනුරාධපුර නුවර ශ්‍රද්ධාවත් වූ එක්තරා ස්ත්‍රියක් නිරන්තරයෙන් මල් කඩා ගෙනවුත් අභයගිරි වෙහෙර දාගැබට පූජා කරන්නීය. **375 පිටුව**)
- ස්වර්ණතිලකා තම මැණියන්ට දොස් නගන්නේ චණ්ඩාල වාදයෙනි. එහෙයින් මෙහි ද චණ්ඩාල කුලයෙහි වූ අය ජීවත්වූහයි සිතිය හැකිය. එසේම එම පිරිස හීන කුලයට අයත් බවද සිතිය හැකිය. (මැණියන්ට චණ්ඩාල කෙල්ලැයි බිණුවාහු ද? ඒ අකුශල කර්මය නිසා... **376 පිටුව**)

***ස්වර්ණතිලකා කතා වස්තුවෙහි භාරතීය වටපිටාවක් හා ලාංකේය වටපිටාවක් ඇති බව හැඳිනගත හැකිය.***

**කුණ්ඩලී වස්තුව ලංකාවේ රුහුණු දනව්ව කේන්ද්‍ර කොටගෙන දිගහැරෙන්නකි. එහි ශාසනට ශෝභාවත්ව තිබූ බව මුලින්ම පැවසේ. ඒ අනුව එකල බුද්ධ සාසනය දියුණු තත්ත්වයක පැවතියහයි සිතිය හැකිය.**

- ❖ ලක්දිව රුහුණු ජනපදයෙහි මාගම නොයෙක් සිය ගණන් සක්මන් මණ්ඩප, පිරිවෙන් ආදියෙන් ප්‍රතිමණ්ඩිත වූ නොයෙක් දහස් ගණන් භික්ෂු සංඝයා වහන්සේ ශෝභාමත්ව තිබෙන්නා වූ තිස්ස නම් මහාවිහාරයෙක් විය. 389 පිටුව)
- ❖ එහිම රුහුණු දනව්වෙහි පාවන නම් ගමක් තිබූ බව සඳහන් වේ. ( ස්වාමිනි නුඹ වහන්සේ ලක්දිව රුහුණු ජනපදයෙහි පාවන නම් ගම සිඟා ලත් අහර ගෙන... 392 පිටුව)
- ❖ බෝධිරාජ වස්තුවෙහි අකුරලි නම් ගමක් ගැන කියැවේ. එහි ද බෞද්ධ ජනතාව විසූ බව පෙනේ. (මෙම ලංකාද්වීපයෙහි ශාසනය පිහිටි පසු අකුරැලි නම් ගමෙක් විය. 394 පිටුව)

ශ්‍රද්ධා සුමනා කතාපුවතේ දැක්වෙන්නේ ස්ත්‍රියක දන්දුන් ආකාරය යි. ඇය තම දෙමාපියන්ට එරෙහිව කටයුතු කළ අයෙකි. අතීතයේ පවා **දෙමාපිය බස් නොඅසන අය** සිටි බවට මෙය සාක්ෂියකි. අනුරාධපුර මහවැලි වීථියෙහි වසන ඇය පසුව මාගමට ගිය බව පැවසේ. ඒ අනුව ග්‍රාම නාම කිහිපයක් මෙයින් දත හැකිය. එහිම **දෙනානක, බගිරිනක, මිරිසවැටි, දකුණුගිරිවිහාරය, මහාවිහාරය** යනාදි භික්ෂූන් වහන්සේ දහස් ගණනින් වැඩ විසූ විහාර කිහිපයක් ගැන දැක්වේ. ශාසනය බැබළුණු සමයක් ලෙස මෙකල හැඳින ගත හැකිය.

**ධම්මස්සවණෝපාසිකා** වස්තුව සහ කුඩ්ඩරජ්ජ වස්තුව දිගහැරෙන්නේ ලංකාවේ රුහුණු ප්‍රදේශය මූලික කරගෙන ය. ධර්මය අසනු රිසි කාන්තාවක් වෙරෙහට බණ ඇසීමට ගොස් ඉතා උනන්දුවෙන් බණ ඇසූ බව මුල් කතාවෙන් දැක්වේ. දෙවැන්නෙහි දි **කුඩ්ඩරජ්ජවාසි** භික්ෂූන් වහන්සේ නමක් අවුරුද්දක් පාසා පැවැත්වෙන අරියවංස නම් දේශනාව අසනු රිසිව බොහෝ දුර සිට පැමිණි භික්ෂුවක බව දැක්වේ. **අරියවංස ධර්ම දේශනාව** යනු මෙකල ප්‍රසිද්ධ ආගමික උත්සවයක් බව හඳුනාගත හැකිය.

මිගපොතක වස්තුවෙහි උදල්කුළු නම් ගමක් ගැන කියවෙන අතර ඒ ගම සමීපයේ වැදිගමක් තිබූ බව සඳහන් වේ. එම විහාරයෙහි ධර්ම දේශනා පැවැත්වුණු බවත් සතුන් පවා බණ ඇසූ බවත් දැක්වේ.

**මේ ආකාරයෙන් දඹදිව මෙන්ම ලක්දිව දේශපාලන තොරතුරු, ආගමික තොරතුරු හා සමාජීය තොරතුරු රාශියක් හෙළි කෙරෙන කෘතියක් ලෙස සද්ධර්මාලංකාරය ප්‍රමාණ කළ හැකිය.**

මේ සැම කථා ප්‍රවෘත්තියකින් ම දෙවන ධම්මකිත්ති හිමියන්ගේ බොදුබැතිමත් බව ප්‍රකට කොට ඇත. එසේම පොළොන්නරු අවසාන යුගයේ දි මාඝගේ ආක්‍රමණයෙන් ලංකාවේ සසුනට මහත් හානියක් වුවත් ගම්පල යුගය වන විට යළිත් එය මනාව ස්ථාපිතව පැවති බව සිතාගත හැකිය. ධර්ම ග්‍රන්ථයක් වශයෙන් සාමාන්‍ය ජනයාට පමණක් නොව දේශපාලනය කරන අයට ද බෞද්ධ දේශපාලන මූලධර්ම හැඳිනගත හැකි කෘතියක් වශයෙන් මෙය වැදගත් වේ.

# ස්තූති යි